සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

14 S I

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ........................................ කතෝලික ධර්මය - I    කාලය : පැය 03යි.

සැළකිය යුතුයි :

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

---

01. ශුද්ධ බයිබලය කිතුනුවන්ගේ අති පූජනීය ග්‍රන්ථය වන්නේ,
    1. ලොව සුපතල ග්‍රන්ථයක් වන බැවිනි.
    2. දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය වන බැවිනි.
    3. භාෂා රාශියකට පරිවර්තනය වී ඇති බැවිනි.
    4. කිතුනුවන්ගේ වේද සත්‍යතා අඩංගු වන බැවිනි.

02. ශුද්ධ බයිබලයේ පොත් 73ටම පොදු ලක්ෂණයකි.
    1. දේවානුභාවයෙන් ලියවී තිබීම.
    2. හීබෘ භාෂාවෙන් ලියවී තිබීම.
    3. ක්‍රි. පූ. 950 දී ලේඛනගතවීම.
    4. ග්‍රීක භාෂාවෙන් ලියවී තිබීම.

03. ක්‍රි. පූ. 950 - ක්‍රි. ව. 100 අතර කාලයේ දී ශුද්ධ බයිබලය,
    1. වාචික සම්ප්‍රදාය තුළ පෝෂණය විය.
    2. වර්ගීකරණය විය.
    3. අතිපූජනීය ග්‍රන්ථයක් ලෙස ව්‍යවහාර විය.
    4. ලේඛනගත විය.

04. ශුද්ධ බයිබලයේ ''විලාප ගී'' අයත් වනුයේ,
    1. ඉතිහාස පොත්වලට ය.
    2. ප්‍රඥා සාහිත්‍ය පොත්වලට ය.
    3. දිවැසිවර ග්‍රන්ථවලට ය.
    4. පංච පුස්තකයට ය.

05. ශුද්ධ බයිබලයේ ප්‍රඥා සාහිත්‍යයට අයත් කෘති දෙකකි,
    1. ජෝබ්, ගීතාවලිය
    2. බාරුක් හා විලාප ගී
    3. ප්‍රේම ගී, විලාප ගී
    4. ජෝබ්, ප්‍රේම ගී

06. ඊශ්‍රායෙල් ජනතාවගේ අත්දැකීම් විශ්වාසයේ ඇසින් අර්ථකථනය කිරීම හඳුන්වන්නේ,
    1. ප්‍රාග් ඉතිහාසය ලෙස ය.
    2. ගැලවීමේ ඉතිහාසය ලෙස ය.
    3. ඓතිහාසික යුගය ලෙස ය.
    4. පැරණි ගිවිසුම ලෙස ය.

07. පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් හඳුන්වන්නේ,
    1. ඓතිහාසික කෘති ලෙස ය.
    2. ජනප්‍රවාදීය කෘති ලෙස ය.
    3. දේව වේදීය කෘති ලෙස ය.
    4. ජුදා ජාතික කෘති ලෙස ය.

08. ශුද්ධ බයිබලයේ ජනප්‍රිය කෘති දෙකකි,
    1. එස්රා හා සිරාක්
    2. තෝබිත් හා සිරාක්
    3. රූත් හා එස්තර්
    4. එස්තර් හා බාරුක්

09. ක්‍රිස්තුන් වහන්සේ කළ කී දේ ලේඛනගතවීම ආරම්භ වූයේ,
    1. ක්‍රි. පූ. 950 දී ය.
    2. ක්‍රි. ව. 64 දී ය.
    3. ක්‍රි. ව. 80 දී ය.
    4. ක්‍රි. ව. 100 දී ය.

10. කතෝලික සභාවේ අනන්‍යතාවයකි,
    1. ඊජිප්තු දේශයෙන් නික්මයාමේ අත්දැකීම.
    2. ශු. බයිබලයේ එන නව ගිවිසුම
    3. ක්‍රිස්තු උත්ථානයේ අත්දැකීම
    4. අපෝස්තුළුවරුන්ගේ සිට පැවත එන සභා සම්ප්‍රදායයන්

11. පහත සඳහන් ග්‍රන්ථ අතරින් ලූක් තුමා කර්තෘත්වය දරන්නේ,
1. පිලමොන් ලිපියෙහි ය. 2. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි ය.
3. ජූද් ග්‍රන්ථයෙහි ය. 4. එළිදරව්ව ග්‍රන්ථයෙහි ය.

12. පාවුලුතුමා පිලිප්පි ලිපිය ලිවීමේ අරමුණ වන්නේ,
1. බොරු ගුරුවරුන්ගේ වැරදි ඉගැන්වීම් නිවැරදි කිරීම.
2. පීඩනයට පත් විශ්වාසකයින් දිරිගැන්වීම.
3. කිතුනු භක්තිකයින්ගේ විශ්වාස ස්ථිර කිරීම.
4. ඇදහිලිවන්තයින් සඳහා සෞභාග්‍යවත් කාලයක් උදාවන බව.

13. රෝම ලිපිය, ගලාති ලිපිය, පිලිප්පි ලිපිය, පිලමොන් ලිපිය යන ලිපි,
1. ශු. පාවුලුතුමා විසින් ම ලියන ලද ලිපිවේ. 2. ද්විතීය පාවුලු ලිපි වේ.
3. ආරූඪ කර්තෘත්වය සහිත ලිපි වේ. 4. වෙනත් ලිපි වේ.

14. කිතු සමිඳුන්ගේ අපෝස්තුලුවරුන් විසින් නොලියූ ලිපියකි,
1. ජාකොබ් ලිපිය 2. හෙබ්‍රෙව් ලිපිය 3. ජූද් ලිපිය 4. ජොහාන් ලිපිය

15. දේව ආදරයේ හා ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ සංකේතය කුරුසය බව සඳහන් වන්නේ,
1. රෝම සහ පිලිප්පි ලිපිවල ය. 2. රෝම සහ ගලාති ලිපිවල ය.
3. පිලිප්පි සහ පිලමොන් ලිපිවල ය. 4. පිලමොන් සහ ගලාති ලිපිවල ය.

16. සංකේත භාවිතයෙන් ලියා ඇති කෘති දෙකකි,
1. දානියෙල් හා පිලමොන් 2. එළිදරව්ව සහ ජොහාන්
3. හෙබ්‍රෙව් හා දානියෙල් 4. දානියෙල් හා එළිදරව්ව

17. කුරුසය අපට පූජනීයවූත් ශුද්ධවත්වූත් වස්තුවක් වන්නේ එය,
1. ආගමික සලකුණක් වන බැවිනි. 2. අපගේ ගැලවීමේ සලකුණ වන බැවිනි.
3. ගෞරවයේ සලකුණක් වන බැවිනි. 4. ආභරණයක් වන බැවිනි.

18. අප, ජීවිතයේ හමුවන බාධක ගැටලුවලට ඉවසීමෙන් මුහුණදීමෙන්,
1. මෙළොව සතුටින් ජීවත්විය හැක. 2. ලෞකිකත්වය පරාජය කළ හැක.
3. අභියෝග ජයගත හැකිය. 4. ස්වර්ගීය සැපත ලබා ගත හැකිය.

19. වර්තමානයේ කරදර, දුක්පීඩා ඉවසා දරා ගැනීමට අපට ආරාධනා කරන්නේ,
1. ප්‍රඥා සාහිත්‍යයෙනි. 2. සුභාරංචි මගිනි.
3. එළිදරව් සාහිත්‍යයෙනි. 4. දිවැසිවර ග්‍රන්ථ මගිනි.

20. එළිදරව්ව 5 පරිච්ඡේදය තුළ ක්‍රිස්තුන් වහන්සේ සංකේතවත් කරන්නේ,
1. කුරුසිය මගිනි. 2. බැටළුවා මගිනි. 3. රාජාලියා මගිනි. 4. පරවියා මගිනි.

21. එළිදරව්ව සාහිත්‍යයේ 4 සහ 12 යන සංඛ්‍යා මගින් සංකේතවත් වන්නේ,
1. විශ්වය හා පූර්ණත්වය යි. 2. පරිපූර්ණත්වය හා විශ්වය යි.
3. විශ්වය හා දේව ජනතාව යි. 4. දේව ජනතාව හා පූර්ණත්වය යි.

22. පහත දැක්වෙන්නේ එළිදරව්ව පොත පිළිබඳව සිසුවෙක් ලියන ලද කරුණු කිහිපයකි.
A ක්‍රි. ව. 80 - 96 අතර කාලයේ දී රචනා වී ඇත.
B ඩොමීෂියන් අධිරාජ්‍යයාගේ කාලයට අයත් වේ.
C සිරියානු අධිරාජ්‍යය සමයේ පීඩාවට පත්වූවන් දිරිමත් කර ඇත.
D කර්තෘත්වය ශු. ජුවාම්තුමාට ආරූඪ කර ඇත.
මෙවායින් නිවැරදි තොරතුරු ඇතුළත් වරණය වන්නේ,
1. ABC ය. 2. BCD ය. 3. ACD ය. 4. ABD ය.

23. ''හොක්මා'' යන හෙබ්‍රෙව් වචනය පැරණි ගිවිසුම තුළ භාවිතා වූයේ
1. ප්‍රඥාව සඳහා ය. 2. එළිදරව්ව සඳහා ය. 3. සංදේශ සඳහා ය. 4. පූර්ණත්වය සඳහා ය.

24. හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද අතර බොහෝ දුරට සමාජයේ ප්‍රභූ පන්තිය සඳහා වූ ප්‍රඥාව හඳුන්වන්නේ,
1. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව ලෙස ය. 2. රාජ්‍ය සභා ප්‍රඥාව ලෙස ය.
3. අභිධාර්මික ප්‍රඥාව ලෙස ය. 4. එදිනෙදා ජීවිතය හා සම්බන්ධ ප්‍රඥාව ලෙස ය.

25. ප්‍රඥා සාහිත්‍යය තුළ දැකිය හැකි අගනා සාහිත්‍යාංගයකි,
1. දේශනා 2. විචාර 3. සංකල්පනා 4. මතවාද

26. ජීවිතයේ අරුත හා සීමාවන් පිළිබඳව අවබෝධ කර දෙන්නේ ශුද්ධ බයිබලයේ,
1. එළිදරව්ව සාහිත්‍යය පොත් මගිනි. 2. නීති පොත් මගිනි.
3. දිවැසිවර පොත් මගිනි. 4. ප්‍රඥා සාහිත්‍යය පොත් මගිනි.

27. ජුදයින් අතට පාවාදුන් ජේසුස් වහන්සේ දෙවන වර විනිශ්චයට ලක්වූයේ,
1. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයේදී ය. 2. සැන්හෙන්ඩ්‍රින් මන්ත්‍රණ සභාවේ දී ය.
3. ආණ්ඩුකාර පිලාත් අභියසදී ය. 4. හෙරෝද් අභියසදී ය.

28. ''ඔබ ක්‍රිස්තුස්ද?'' යන ප්‍රශ්නය ජේසුස් වහන්සේගෙන් අසන ලද්දේ,
1. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයේදී ය. 2. උත්තම පූජකයාගේ මැදුරේදී ය.
3. පිලාත්ගේ මාළිගයේදී ය. 4. හෙරෝද්ගේ මාළිගයේදී ය.

29. ජේසුස් වහන්සේ අයිති පාලන ප්‍රදේශය වූයේ,
1. ජුදයාව ය. 2. සමාරියාව ය. 3. ගලීලය ය. 4. ඉදුමිය ය.

30. උත්ථානවූ ජේසුස් වහන්සේ රොටී ආශිර්වාදකර පූප කඩන ලද්දේ,
1. පාස්කු ඉරුදින සවස අපෝස්තුළුවරුන් වෙත වැඩම කිරීමේදී ය.
2. පාස්කු ඉරුදින ගෝලයන් දෙදෙනාට දර්ශනය වීමේදී ය.
3. අට දිනකින් තෝමස්තුමාට දර්ශනයවීමේදී ය.
4. මද්ගලාවේ මරියාට දර්ශනය වීමේදී ය.

31. ''මම අල්පා සහ ඔමෙගා ය'' මෙලෙස සඳහන් වන්නේ,
1. එළිදරව්ව පොතේ ය. 2. උත්පත්ති පොතේ ය.
3. නික්මයාම පොතේ ය. 4. හිතෝපදේශයේ ය.

32. ශුද්ධවන්තව ජීවත්වීම තුළ අපට උරුමකරගතහැකි වන්නේ,
1. මෙළොව ප්‍රීතිය යි. 2. අන් අයගේ ප්‍රසාදය යි.
3. සදාතන ජීවිතය යි. 4. දේව කරුණාව යි.

33. පෙන්තකොස්ත මංගල්‍ය සැමරීම සඳහා ජුදෙව්වරු වන්දනා ගමන් යනු ලැබුවේ,
1. බෙත්ලෙහෙම් නුවරට ය. 2. ජෙරුසලම් දේවමාළිගාවට ය.
3. ධර්මසභා මණ්ඩපයට ය. 4. නාසරෙත් නුවරට ය.

34. A - යාච්ඤාවේ නිරතව සිටින ලදී.
B - සැඩ සුළඟක හඬක් ඇසෙන ලදී.
C - හිරු අඳුරු වී අන්ධකාරයක් පැතිරෙන ලදී.
D - ජීවිත වෙනසක් ඇතිවෙන ලදී.
ඉහත ප්‍රකාශ අතරින් ශුද්ධාත්මාගමනයට අදාළ කරුණු ඇතුළත් වරණය වන්නේ,
1. ABC ය. 2. BCD ය. 3. ACD ය. 4. ABD ය.

35. ශුද්ධාත්ම වරම් ලැබූ තැනැත්තා සූදානම්ව සිටිය යුත්තේ,
1. අන්තවාදයට එරෙහිව සටන් කිරීමට ය. 2. සතුරාට එරෙහිව අභියෝග කිරීමට ය.
3. විශ්වාසයට එරෙහි අභියෝග ජයගැනීමට ය. 4. අවශ්‍යතා සපුරා ගැනීමටය.

36. ශුද්ධාත්ම මෙහෙයවීම තුළ විජාතික කෝරනේලියස් බෞතීස්මය ලැබීමට හේතුව වූයේ,
1. ස්නාවක ජොහාන්තුමාගේ දේශනය යි.
2. පාවුළුතුමාගේ දේශනය යි.
3. පේදුරුතුමාගේ දේශනය යි.
4. ස්තේපන්තුමාගේ දේශනය යි.

37. ශු. පාවුලුතුමා විශේෂ වරප්‍රසාදවලට හිමිකරුවෙකු වූයේ,
1. බෙන්ජමින් ගෝත්‍රයට අයත් වූ නිසා ය.
2. තාර්සස්හි උපත ලැබූ නිසා ය.
3. ගමාලියෙල් යටතේ අධ්‍යාපනය ලැබූ නිසා ය.
4. පියාගේ රෝම පුරවැසිභාවය නිසා ය.

38. ස්තේපන්තුමාව ගල්ගසා මරා දැමූ විට සාවුල් සතුට ප්‍රකාශ කළේ,
1. දෙවියන් වහන්සේට ඇති ආදරය නිසා ය.
2. ජීවමාන ක්‍රිස්තුන් වහන්සේව නාඳුනන නිසා ය.
3. ගැඹුරු ඥානයක් තිබූ නිසා ය.
4. රෝම පුරවැසියෙකු වූ නිසා ය.

39. පාවුලුතුමා අසහාය ධර්මදූතවරයෙක් වූයේ,
1. අනනියස්ගෙන් ප්‍රසාද ස්නාපනය ලැබූ නිසා ය.
2. උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේ මුණ ගැසුණු නිසා ය.
3. දේව අනාවරණයට නතු වූ නිසා ය.
4. ජුදා දහමට බෙහෙවින් ඇලුම්කළ නිසා ය.

40. පාවුළුතුමා මරණයට පත්වන විට පැවති පීඩා සමය වන්නේ,
1. ඇන්ටිපස්ගේ පීඩා සමය ය.
2. ඩොමීෂියන්ගේ පීඩා සමය ය.
3. හෙරෝද් අග්‍රිපාගේ පීඩා සමය ය.
4. නීරෝගේ පීඩා සමය ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

14 | S | II

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ....................................... කතෝලික ධර්මය - II

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (i) ශුද්ධ වූ බයිබලයේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
(ii) නීති පොත් ගණයට අයත් පොත් දෙකක් නම් කරන්න.
(iii) නෙහෙමියා හා ජෝවෙල් අයත් පොත් කාණ්ඩ දෙක සඳහන් කරන්න.
(iv) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා වී ඇති නගරය හා කාලය සඳහන් කරන්න.
(v) පාවුළුතුමා කිතුනු සංසවලට උපදෙස් දීමට ලියූ ලිපිවලින් පැහැදිලිවන කරුණු දෙකක් සඳහන් කරන්න.
(vi) ද්විතීය පාවුළු සංදේශ දෙකක් නම් කරන්න.
(vii) එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(viii) එළිදරව් සාහිත්‍යයේ ''සුදු'' හා ''රතු'' වර්ණවල අර්ථ වෙන වෙනම සඳහන් කරන්න.
(ix) දානියෙල් හා එළිදරව් ග්‍රන්ථ රචනා වී ඇති අධිරාජ්‍යය දෙක නම් කරන්න.
(x) අභිධාර්මික ප්‍රඥාව සඳහන් ග්‍රන්ථ දෙක සඳහන් කරන්න.

02. (i) ද්විත්වවාදය තුළ ගැටුමක් ඇති කරන බලවේග දෙක නම් කරන්න.
(ii) යුගාන්තවාදයෙන් පෙන්නුම් කරන කරුණු තුනක් සඳහන් කරන්න.
(iii) කිතුනුවෙකු ලෙස ස්වර්ගීය සැපත උරුමකර ගැනීමට ඔබ කරන යෝජනා පහක් සඳහන් කරන්න.

03. (i) ප්‍රඥා සාහිත්‍යයේ දක්නට ලැබෙන අංග දෙකක් නම් කරන්න.
(ii) හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද තුන ලියා දක්වන්න.
(iii) ජීවිතයට එල්ල වන විවිධ අභියෝග හමුවේ ඔබ ප්‍රඥාවන්තව කටයුතු කරන ආකාර පහක් සඳහන් කරන්න.

04. (i) ජුදා ශ්‍රේෂ්ඨාධිකරනයේදී ක්‍රිස්තුන් වහන්සේ අසන ලද ප්‍රශ්නය හා එයට දුන් පිළිතුර ලියා දක්වන්න.
(ii) ජුදයින් විසින් ජේසුස් වහන්සේට එල්ල කළ චෝදනා තුනක් සඳහන් කරන්න.
(iii) චතාරික සමය තුළ සැබෑ ජීවිත අරුතක් ඇතිකර ගැනීමට ඔබ කරන යෝජනා පහක් ගෙන හැර දක්වන්න.

05. (i) කුරුසියේ එල්ලා සිටි ජේසුස් වහන්සේ විසින් විඳින ලද ගැරහුම් දෙකක් සඳහන් කරන්න.
(ii) ජේසුස් වහන්සේගේ උත්ථානයේදී පරිසරයේ සිදු වූ වෙනස්කම් තුනක් දක්වන්න.
(iii) ''දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම තුළින් නව අහසක් හා නව පොළොවකට ඇතුළුවීමට ලැබේ.'' යන මැයින් පුවත් පතකට ලිපියක් සකස් කරන්න.

06. (i) ශුද්ධ වූ සභාවේ හා අපෝස්තුලුවරු අතර පළමුව ප්‍රාණ පරිත්‍යාගි වූ දෙදෙනා නම් කරන්න.
(ii) උපස්ථාදායකයින් පත් කිරීමේ දී සලකා බැලූ ගුණාංග තුනක් සඳහන් කරන්න.
(iii) ශුද්ධාත්ම වරමින් පූර්ණ වූ ඔබ විශ්වාසය වෙනුවෙන් සාක්ෂි දැරූ අවස්ථාවක් සැකැවින් විස්තර කරන්න.

07. **පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.**
(i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
(ii) මුල් කිතුනු සභාව
(iii) පාස්කු අභිරහස
(iv) ශුද්ධවූ පාවුළුතුමා

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Answer**

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**14 | S | I-II**

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

### කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 3 | 31. | 1 |
| 02. | 1 | 12. | 3 | 22. | 4 | 32. | 3 |
| 03. | 4 | 13. | 1 | 23. | 1 | 33. | 2 |
| 04. | 3 | 14. | 2 | 24. | 2 | 34. | 1 |
| 05. | 1 | 15. | 1 | 25. | 3 | 35. | 3 |
| 06. | 2 | 16. | 4 | 26. | 4 | 36. | 3 |
| 07. | 3 | 17. | 2 | 27. | 3 | 37. | 4 |
| 08. | 3 | 18. | 3 | 28. | 1 | 38. | 2 |
| 09. | 2 | 19. | 3 | 29. | 3 | 39. | 3 |
| 10. | 4 | 20. | 2 | 30. | 2 | 40. | 4 |

(ලකුණු 1 × 20 = ලකුණු 20කි)

### II කොටස

01. (i) පුරාණ ගිවිසුම, නව ගිවිසුම
(ii) උත්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කථාව, ද්වීතීය නීති සම්ප්‍රදාය
(iii) ඉතිහාස පොත්, දිවැසිවර ග්‍රන්ථ
(iv) ග්‍රීසිය, ක්‍රි. ව. 80 - 90 අතර කාලය
(v) එතුමාගේ නායකත්වය, සංඝ සමග සබඳතා පැවැත්වූ ආකාරය
(vi) එපීස, කොලොස්සී, 2 තෙසලෝනික
(vii) ද්විත්වාදය, යුගාන්තවාදය, සංකේත භාවිතය, ආරූඪ නාමයකින් ඉදිරිපත් කර තිබීම.
(viii) සුදු - ජයග්‍රහණය, රතු - යුද්ධය ලේ වැගිරීම්
(ix) සිරියානු අධිරාජ්‍යය, රෝම අධිරාජ්‍යය
(x) ජෝබ් සහ ධර්මදේශකයා

02. (i) යහපත, අයහපත
(ii) පරම යහපත හා පරම අයහපත අතර ගැටුම, අනාගතයේදී පරම යහපත ජයග්‍රහණය කරන බව, සියලු නපුරු බලවේග විනාශ වන බව (10 පෙළපොත 11 පිටුව බලන්න.)
දසපනතට අනුව දිවි ගෙවීම, සක්‍රමේන්තු ජීවිතයකට යොමු වීම, යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම, පුන්‍ය ක්‍රියාවල
නිරතවීම, ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කිරීම.
(iii) ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබාදෙන්න.

03. (i) ප්‍රස්තාව පිරුළු, උපදේශ, කතාන්දර, සංකල්පනා, ගීත
(ii) පවුල හා ගෝත්‍රික ප්‍රඥාව, රාජ්‍ය සභා ප්‍රඥාව, අභිධාර්මික ප්‍රඥාව එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව
(iii) ලියා ඇති පිළිතුර සලකා ලකුණු දෙන්න. (විශ්වාසයෙන් යුතුව යාච්ඤා කිරීම, වැඩිහිටි උපදෙස් පැතීම, සහා නායකයන්ගේ උපදෙස් පැතීම, ධෛර්යවන්තවීම, ශුද්ධාත්ම වරම් පැතීම.

04. (i) ඔබ ක්‍රිස්තුස් ද? මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයාණෝ දෙවියන් වහන්සේගේ බල පරාක්‍රමයේ දකුණු පස වැඩ හිඳිනු ඇත.
(ii) ජාතියට කැරළි ගැසීමට පොළඹවන බව, අධිරාජ්‍යයාට අයබදු දීම තහනම් කරන බව තමා ''ක්‍රිස්තුස්'' නම් රජෙක් යයි කියා ගන්නා බව.
(iii) ලියා ඇති පිළිතුරට ලකුණු ලබා දෙන්න. (වරදට සමාව දීම, සතුරාට වුවද ප්‍රේම කිරීම, වත ඉරාගෙන නොව සිත ඉරාගෙන ජීවත් වීම, සැබෑ මනස්ථාපනයන් ඇති කර ගැනීම, මර්දනාවේ ජීවිතයක් ගත කිරීම.)

05. (i) සරදම් කිරීම, කාඩි පිළිගැන්වීම, වස්ත්‍ර බෙදා ගැනීමට දාදු දැමීම, ජේසු නසරේනු ජුදයින්ගේ රජ යනුවෙන් ලියූ පුවරුව කුරුසියට ඉහළින් තැබීම.
(ii) හිරු අඳුරු වීම, රටපුරා අන්ධකාරයක් පහළ වීම, දේව මාලිගයේ තිරය දෙකඩ වී ඉරී ගියේය.
(iii) ලියා ඇති පිළිතුරුවලට ලකුණු දෙන්න.

06. (i) ශු. ස්තේපන්තුමා, ශු. මහා ජාකොබ් තුමා
(ii) යහපත් දිවි පෙවෙතක් ගත කිරීම, ශුද්ධාත්තමයාණන්ගෙන් පූර්ණ වීම, ප්‍රඥාවෙන් පූර්ණ වීම.
(iii) ලියා ඇති පිළිතුරට ලකුණු දෙන්න.

07. (i) අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත 10/5 පිටුව
(ii) පාස්කු අභිරහස 10/6 පාඩම
(iii) මුල් කිතුනු සභාව 10/7 පාඩම
(iv) ශුද්ධවූ පාවුලු තුමා 10/8 පාඩම